මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 02 -2020

---

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන- අදියර 02 හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 මැයි 18 වන දින එළඹි ණය ගිවිසුම් අංක 3625 – (එස්ආර්අයි) හි 4.02(අ) වගන්තිය සහ ණය ගිවිසුම් අංක 3626 – (සීඕඑල්) හි 4.02(අ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

වැඩසටහනේ ණය ගිවිසුම් අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සඳහා ජලය ලබා ගැනීමේ හැකියාව තහවුරු කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 43,734කට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 242 ක් වූ අතර, ඉන් රුපියල් මිලියන 37,951කට සමාන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 210ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කිරීමට එකඟත්වය පළ කර ඇත. රුපියල් මිලියන 5,783ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කර ඇත. මෙම වැඩසටහනෙහි කටයුතු 2018 ජූලි 23 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් 31 දින වන විට එය නිම කිරීමට නියමිත ය.

## 1.3 තත්වාගණනය කළ මතය

මතය සඳහා පදනම කොටසේ විස්තර කෙරෙන කරුණුවල බලපෑම හැරුණු කොට, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

රුපියල් 105,881,458ක අගයක පොළී සහ කැපවීම් ගාස්තු, මූල්‍ය ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. කෙසේවෙතත්, විමසන ලදුවත්, ගණනය කිරීම්වල විස්තර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනෙහි මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** භෞතික කාර්යසාධනය

**2.1** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| අ) | කළුගඟ හා මොරගහකන්ද හුවමාරු ඇල ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය සියයට 89ක් අපේක්ෂා කළද, 2020 දෙසැම්බර් 31 දිනට සියයට 52 ක ප්‍රගතියක් ළඟා කරගෙන තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අනපේක්ෂිත ප්‍රමාදයන්. එය අතිරේක මූල්‍යයන අවශ්‍යතා ඇති කළ හැක. තවදුරටත් එය කෘෂිකාර්මික කටයුතුවලටත් බලපෑමක් වනු ඇත. | අදහස් දැක්වීමට යටත්ව එකඟ නොවේ. දේශීය කම්කරුවන් ආසාදනය වීම සහ චීන කම්කරුවන් හටද සංචරන සීමා පැනවීම හේතුවෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය 2020 වර්ෂයේ ප්‍රගතිය කෙරෙහි අහිතකරව බලපා ඇත. | ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අනපේක්ෂිත ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| ආ) | 2018 සිට 2024 දක්වා අදියර 03 ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණද, 2018 සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි. එබැවින් අදියර 03 යටතේ තවමත් කොන්ත්‍රාත් පැකේජ 08 ක් ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අනපේක්ෂිත ප්‍රමාදයන්. එය අතිරේක මූල්‍යයන අවශ්‍යතා ඇති කළ හැක. තවදුරටත් එය කෘෂිකාර්මික කටයුතුවලටත් බලපෑමක් වනු ඇත. | අදියර 03 හි ණය ගිවිසුම අත්සන් කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අවශ්‍ය සාකච්ඡා පැවැත්වේ. කෙසේවෙතත්, සඳහන් කළ කොන්ත්‍රාත් පැකේජ ඇගයීම සහ අවසන් කිරීමට මූලික පියවර ගෙන ඇත. | ඉදිකිරීම් වැඩ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අනපේක්ෂිත ප්‍රමාදයන් අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| ඇ) | 2019 – 2020 තුළදී ක්‍රියාත්මක කිරීමය සැළසුම් කළ සමෝධානික ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ උපදේශන සේවා 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ජල සම්පත් කළමනාකරණ කටයුතු සහ අවසානයේ වැඩසටහනේ ප්‍රතිලාභවලටත් අහිතකර ලෙස බලපායි. | මෙම උපදේශන සේවා සඳහා කෙටුම්පත් වාර්තාව උපදේශක විසින් ඉදිරිපත් කරන ලදී. පවතින සීමා හේතුවෙන් ප්‍රධාන පාර්ශ්වයන් සමඟ ජාතික වැඩමුළුව පැවැත්වීමට සහ රජයේ දැක්ම සම්පූර්ණ කිරීමට ව්‍යාපෘතියට නොහැකි විය. කෙසේවෙතත්, 2021 අගෝස්තු 31 වන විට මෙම අධ්‍යයනයේ විෂයපථය තහවුරු කිරීමට උපදේශක අපේක්ෂා කරයි. | ප්‍රමාදයකින් තොරව අදාළ කාල සීමාව තුල උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**2.2** පද්ධති හා පාලනයන්

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| අ) | 2020 නොවැම්බර්/ දෙසැම්බර් පැවති ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරක සැමරුමේ හි අදියර 2 හි මධ්‍යකාලීන සමාලෝචන මෙහෙයුම සහ අදියර 1 හි සමාලෝචන මෙහෙයුම අනුව, ආයෝජන වැඩසටහන සම්පූර්ණ කිරීමට ඇමෙරිකානු ඩොලර් මිලියන 400ක අතිරේක අරමුදල් අවශ්‍ය වන බව වර්තමානයේ ඇස්තමේන්තු කර ඇත. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දින වන විටත් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කර අතිරේක අරමුදල් අවශ්‍යතාවය සඳහා අවසාන එකඟතාව ලබාගෙන නොතිබුණි. අතිරේක අරමුදල් සඳහා අවසාන එකඟතාව නොමැතිව, අනුමත ණය මුදල ඉක්මවා කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. එබැවින් 2020 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ඩොලර් මිලියන 114ක් සඳහා සම මූල්‍ය පහසුකම් සපයන්නෙකු සූදානම් කර ගැනීමට අපොහොසත් වී ඇති හෙයින් අනාගතයේ අරමුදල් හිඟයක් ඇති විය හැක. | අතිරේක අරමුදල් අවශ්‍යතා ඇති විය හැක. එසේම වැඩසටහනේ සියළු ක්‍රියාකාරකම් ඉටු කළ නොහැකි අතර අපේක්ෂිත අවසාන ප්‍රතිලාභ ළඟා කර ගත නොහැකි වනු ඇත. | ඔබගේ වාර්තාවේ සඳහන් කාරණය භාණ්ඩාගාර ලේකම් ද ඇතුළුව භාණ්ඩාගාර නිළධාරීන් සමඟ සාකච්ඡා කර ඇත. විස්තරාත්මක සාකච්ඡා කිහිපයකින් අනතුරුව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. | වැඩසටහන විසින් ණය ගිවිසුමේ වූ අනුමත ණය සීමාව තුළ කොන්ත්‍රාත් පිරිනැමිය යුතුය. කොන්ත්‍රාත් වටිනාකම අනුමත ණය සීමාව ඉක්ම වුවහොත්, වරඩසටහන අතිරේක අරමුදල් සපයා ගැනීම හෝ වැඩසටහනේ පිරිවැය අඩු කර ගැනීම කළ යුතුය. |
| ආ) | අදියර 1 සහ 2 යටතේ සිවිල් වැඩ කොටස් සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 306ක් වෙන් කර තිබුණි. නමුත් ඇමෙරිකානු ඩොලර් මිලියන 432 ක කොන්ත්‍රාත්තු අදියර 1 සහ 2 යටතේ ප්‍රදානය කර තිබුණි. එබැවින් සිවිල් වැඩ සඳහා වූ ණය මුදල අනුමත සීමාවට වඩා ඇමෙරිකානු ඩොලර් මිලියන 126 ක් හෙවත් සියයට 41 ක් ඉක්මවා තිබුණි. | එය අතිරේක අරමුදල් අවශ්‍යතාවයක් ඇති කළ හැකිය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, වැඩසටහනේ අදියර 1, 2 සහ 3 හි පවතින ආසියානු සංවර්ධන බැංකු අරමුදලට අනුව අවශෝෂණය නොකළ වියදම් සහ අනාගත අපේක්ෂිත වියදම් සඳහා ඉඩ සැලසීමට අදියර 1 සහ 2 යළි සැළසුම් කිරීමට උපදෙස් ලබා දී ඇති අතර අදියර 3 ගිවිසුම අත්සන් කර ඇත. | ණය ගිවිසුමේ අනුමත ණය මුදල තුළ වැඩසටහන විසින් කොන්ත්‍රාත්තු ප්‍රදානය කළ යුතුය. අනුමත ණය මුදල කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවන්නේ නම්, වැඩසටහන අතිරේක අරමුදලක් සූදානම් කර ගැනීම හෝ වැඩසටහන් පිරිවැය අවම කිරීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ) | 2020 ක්‍රියාකාරී සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබුණි. එම ක්‍රියාකාරී සැලැස්ම යටතේ රුපියල් මිලියන 10,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. නමුත් භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 16,627ක් වෙන්කර තිබුණි. මේ සම්බන්ධයෙන් සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර නොතිබුණි. වැඩසටහන් ප්‍රගති වාර්තාවට අනුව වියදම රුපියල් මිලියන 10,447 ක් වාර්තා වී නොතිබුණි. නමුත් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව වියදම රුපියල් මිලියන 11,329ක් ලෙස දැක්වේ. එබැවින් වැඩසටහන් ප්‍රගති වාර්තාවේ දක්වා ඇති මුදල සහ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අතර රු.මිලියන 882 ක වෙනසක් නිරීක්ෂණය විය. | විශ්වාස කළ නොහැකි තොරතුරු උත්පාදනය කළ හැකි අතර තීරණ ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපායි | අමාත්‍යාංශ වෙනස් කිරීම, කලින් කල පරිපූරක ප්‍රතිපාදන ලබා දීම සහ අධීක්ෂණ හා ඇගයීම් විශේෂඥයා ඉවත් වීම මෙන්ම වැඩසටහන් අධ්‍යක්ෂවරයා වෙනස් කිරීම හේතුවෙන් මූලික ක්‍රියාකාරී සැලැස්ම සහ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම ලේකම්වරයා වෙත අනුමැතිය සඳහා යොමු කර නොමැත. ඉදිරියේදී මෙම තත්ත්වය මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ වියදම රුපියල් මිලියන 10,447 ප්‍රගති වාර්තාවේ සඳහන් විය. කෙසේ වෙතත්, භාණ්ඩාගාරයේ පොත් වසා දැමීමෙන් පසු, අවසාන මුද්‍රිත සටහනේ දැක්වෙන වියදම රුපියල් මිලියන 11,329 ක් විය. වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් ගිණුම් පොත් වෙත වලට ගොස් නොමැති ආසියානු සංවර්ධන බැංකුව විසින් කරන ලද සෘජු ගෙවීම් මෙම වෙනසයි. ප්‍රගති වාර්තාව සකස් කරන විට මෙම තොරතුරු වැඩසටහන් කළමනාකරණ ඒකකය වෙත ලැබී නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගති වාර්තාව නිවැරදි සංඛ්‍යා මත පදනම්ව සකස් කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්ම සහ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කළ යුතුය. |
| ඈ) | 2020 දෙසැම්බර් මාසයේදී කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණද, පිරිවැය රුපියල් මිලියන 43,279ක් වූ UECP-ICB 02A කොන්ත්‍රාත් පැකේජය 2020 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | පද්ධතියට සහ පාලන ක්‍රියාකාරකම් වලට අහිතකර ලෙස බලපායි | UECP-ICB 02A කොන්ත්‍රාත්තුව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ බව පිළිගනු ලැබේ. රජයේ කඩිනම් සංවර්ධන වැඩසටහනට අනුව රජයේ ඉහළ නිලධාරීන්ගේ නිර්දේශ මත අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. | වැඩසටහන ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක විය යුතුය. ක්‍රියාකාරී සැලැස්ම වත්මන් අවශ්‍යතාවයට අනුව අදාළ අනුමැතිය සහිතව සංශෝධනය කළ යුතුය. |